විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/ 2010 දිනය / திகதி / Date 2010- 03- 10

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 01/ 2010**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා</u>**
**<u>මනාපය පලකිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම</u>**

1983- 08- 01 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් සහිත තනතුරකට පත්කරනු ලැබූ එදිනට සේවයේ නියුක්තව සිටි රාජ්‍ය නිලධාරිණියන් හට වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුලත්වීමේ මනාපය පලකිරීමේ කාලය විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 6/ 2009 මඟින් 2009- 06- 30 දක්වා දීර්ඝකර තිබුණි.

එහෙත් එම කාලය තුළ මනාපය පලකිරීමට නොහැකි වූ නිලධාරිණියන් සඳහා 2010- 06- 30 දින දක්වා මනාපය පලකිරීමේ කාලය අංක 1639/ 27 – 2010 පෙබරවාරි 05 දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා 2010- 02- 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/ 2001 VII මඟින් දීර්ඝකර ඇති බව මෙයින් දන්වමි.

වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට ඇතුලත්වීමේ මනාපය පලකිරීමේ කාලය අවසාන වශයෙන් මෙවර පමණක් දීර්ඝ කරනු ලබන බවද වැඩිදුරටත් දන්වා සිටිමි.

එකී චක්‍රලේඛණයේ සඳහන් නියමයන් හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 13/ 2001 VII හි සඳහන් නියමයන් අතුරින් පහත සඳහන් වූ සංශෝධනයන්ට යටත්ව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

i. නිලධාරිණියක් විසින් විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා මනාපය ප්‍රකාශ කිරීමට තීරණය කරනු ලැබිය හැක්කේ යම් දිනකට පෙරද එම දිනය 2010- 06- 30 ලෙසද,

ii. නිලධාරිණිය විශ්‍රාම ලබා ඇත්නම් අයවිය යුතු හිඟ දායක මුදල් සහ වැල් පොළිය වාරික 180 කින් අයවිය යුතු බවද,



| | Telephone | Fax | | Telephone | Fax | | Telephone | |
|---|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 | |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 | |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 | E-mail: pensions@sltnet.lk |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 | Web site: www.pensions.gov.lk |

iii. තවද, නිලධාරිණියක් මියගොස් ඇත්නම් අදාල දායක මුදල සහ පොළිය ප්‍රදානයෙන් එකවර අඩුකළ යුතු බවත්, නිලධාරිණිය සේවයේ යෙදී සිටින්නේ නම් ඇය විශ්‍රාම යාමට පෙර මුළු දායක මුදල සහ පොළිය අඩු කළ යුතු බවත් නියම කරමි.

iv. දායක මුදල් අයකිරීම විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/ 2008 ප්‍රකාරව සිදු කළ යුතුය.

පහත සඳහන් තැනැත්තන්ට මෙම මනාපය පළ කළ හැක.
(1983- 08- 01 දින සේවයේ යෙදී සිටි නිලධාරිණියන්ට අදාල වේ)

1. දැනට සේවයේ යෙදී සිටින (1983- 08- 01 දිනට පෙර පත්වීම් ලැබූ) මනාපය පළ කිරීමට කැමති නිලධාරිණියන්.
2. දැනට විශ්‍රාම ලබා ඇති මනාපය පළ කිරීමට කැමති නිලධාරිණියන්.
3. මනාපය පළ කිරීමට දී ඇති අවසාන දිනයට පෙර මියගොස් ඇති නිලධාරිණියන්. (මෙහිදී වැන්දඹු පුරුෂයා හෝ අනත්දරුවන් හෝ අනත්දරුවන්ගේ භාරකරුවන් ලවා පොදු 86 "අ" ආකෘති පත්‍රය අත්සන් කළ හැකිය).

කේ.ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. ලේකම් - රාජ්‍ය සේවා කොමිෂන් සභාව
5. ලේකම් - අධිකරණ සේවා කොමිෂන් සභාව
6. සම සභාපති - ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව
7. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
8. ලේකම් - මුදල් අමාත්‍යාංශය
9. විගණකාධිපති